# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2018 අංක 30 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2018 සැප්තැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 සැප්තැම්බර් මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 8.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2018 අංක 30 දරන**
**ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2018 සැප්තැම්බර් මස 28 වන දින]

එල්.ඩී.—ඕ. 3/2016

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2018 අංක 30 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1987 අංක 15 දරන පනතේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (xiv) වන ඡේදයේ "ගම්වල වැඩ ඉදිකිරීම හෝ වෙනස් කිරීම," යන වචන වෙනුවට "ගම්වල හෝ වතු ජනාවාසවල වැඩ ඉදිකිරීම හෝ වෙනස් කිරීම," යන වචන ආදේශ කිරීමෙන්;

(2) (xxii) වන ඡේදයේ "තෝරාගත් ගම්වල ඒකාබද්ධ සංවර්ධන" යන වචන වෙනුවට "තෝරාගත් ගම්වල, වතු ජනාවාසවල ඒකාබද්ධ සංවර්ධන" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන් සහ එම නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "නඩත්තු කිරීම සඳහා, එකී ඉදිකිරීම" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"නඩත්තු කිරීම සඳහා, එකී අයිතිකරු හෝ අයිතිකරුවන් සමඟ ගිවිසුමකට බැඳිය හැකි ය.";

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:—

"(2) වැවිලි ප්‍රදේශ සම්බන්ධයෙන් වන විට, ප්‍රාදේශීය සභාව විසින්, විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව සහ අදාළ වත්තෙහි පාලනාධිකාරිය විමසා, අදාළ වැවිලි ප්‍රදේශවල පදිංචිකරුවන්ට අවශ්‍ය පාරවල්, ළිං සහ එම පදිංචිකරුවන්ගේ සුබසාධනය සඳහා අවශ්‍ය වන වෙනත් පොදු පහසුකම් ලබා දීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල උපයෝගී කරගනු ලැබිය හැකි ය.

(3) (අ) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ ඉදිකරන ලද, නඩත්තු කරන ලද හෝ සලස්වන ලද පාරවල්, ළිං සහ පොදු පහසුකම්, සුදුසු සාධන පත්‍රයක් මගින් ප්‍රාදේශීය සභාව සතු කර දෙනු ලැබිය යුතු අතර ප්‍රසිද්ධ පාරවල්, ළිං සහ පොදු පහසුකම් ලෙස සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රාදේශීය සභාව විසින්, එකී පාරවල්, ළිං සහ පොදු පහසුකම් ඉදිකිරීම, නඩත්තු කිරීම හෝ සැලැස්වීම පිළිබඳව වන වියදම් වෙනුවෙන්, අවස්ථාවෝචිත පරිදි, එම වතුවල හෝ කර්මාන්තවල අයිතිකරුවන්, අදාළ වතුවල පාලනාධිකාරීන් හෝ එම වැවිලි ප්‍රදේශවල පදිංචිකරුවන් විසින් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි වන දායක මුදලක් ගෙවිය යුතු බව නියම කරනු ලැබිය යුතු ය. තව ද, එකී සියලු ම දායක මුදල්, එසේ ප්‍රයෝජනය ලත් ඉඩම් සහ වැවිලි ප්‍රදේශ සඳහා නියම කරන ලද විශේෂ වරිපනම් බද්දක් ලෙස සැලකිය යුතු අතර, ඒවා මේ පනතේ විධිවිධාන යටතේ පනවනු ලැබ ඇති වරිපනම් බද්දක් වශයෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "වැවිලි ප්‍රදේශ" යන්නෙන් මධ්‍යම, ඌව, සබරගමුව, දකුණ, බස්නාහිර,

උතුරු මැද සහ වයඹ පළාත් තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ පවතින, නේවාසික කම්කරුවන් වාසය කරන සහ තේ, රබර්, පොල්, කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි හෝ ඔයිල් පාම් වගා කරනු ලබන වතු අදහස් වේ.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

CS CamScanner